සැබැවින්ම නුඹලාට පෙර සිටියවුන්ගේ පිළිවෙත් නුඹලා වියතින් වියත බාහුවෙන් බාහුව අනුගමනය කරනු ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ සඊද් අල් කුද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "සැබැවින්ම නුඹලාට පෙර සිටියවුන්ගේ පිළිවෙත් නුඹලා වියතින් වියත බාහුවෙන් බාහුව අනුගමනය කරනු ඇත. එය
කෙතරම් ද යත්, ඔවුන් තලගොයි ගුලකට පිවිසුණද නුඹලා ද ඔවුන් අනුකරණය කරනු ඇත.” අපි: "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! (ඔවුන්) යුදෙවවන් හා කිතුනුවන් දැ?"යි විමසුවෙමු.
එතුමා: “වෙන කවුරුන්දැ?”යි එතුමා ප්රකාශ කළහ.
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තමන්ගේ යුගයෙන් පසු තම සමූහයාගේ තත්ත්වය කෙසේ වනු ඇත්දැ?යි දන්වා සිටියහ. එනම් ඔවුන් යුදෙව් හා කිතුනුවන්ගේ ප්රතිපත්තීන්, ක්රියාමාර්ග, සිරිත් විරිත් හා ඔවුන්ගේ සම්ප්රදායන් තුළ ඔවුන්ගේ මාර්ගය අනුගමනය කිරීම ය. එමෙන්ම තත්ත්පරයෙන් තත්ත්පරය, අඟලින් අඟල, රියනෙන් රියන ඔවුන්ව අනුකරණය කිරීමය. ඔවුන් තලගොයි ගුලකට ගිය ද මොවුන් ද ඒ තුළට ඔවුන් පසුපස පිවිසෙනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/3355